### ණය ඇපකර අරමුදලෙන් හිමිකම් පෑම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

1. අරමුදලින් හිමිකම් පෑ හැකි අවස්ථා
    - නිලධාරියා/නිලධාරිනිය මරණයට පත්වීම.
    - නිලධාරියා/නිලධාරිනිය පූර්ණ අකර්මන්‍ය තත්ත්වයට පත්වීම.

2. අරමුදලින් හිමිකම් පෑ නොහැකි අවස්ථා
    - මරණයට හේතුව සියදිවි හානි කර ගැනීමක් නම්,
    - සේවය හැරයාම, සේවයෙන් පහ කිරීම හෝ වැඩ තහනමකට ලක්වීම.

3. ආයතන ප්‍රධානියා විසින් තම ආයතනයේ සේවයේ යෙදෙමින් සිටියදී මියගිය හෝ පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ හෝ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්නා ලද නිලධාරීන්/නිලධාරිනියන් ඉහත දේපල ණය අරමුදල යටතේ හිමිකම් ලබයි නම්, (ආයතන සංග්‍රහයේ 11.8 වගන්තිය ප්‍රකාරව) ඔවුන්ගේ කාලත්‍රයා/යැපෙන්නන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබාගෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පහත තොරතුරු එවිය යුතු වේ.
(අදාල ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ " ණය ඇපකර අරමුදලේ හිමිකම් පෑම " යන්න සඳහන් කරන්න.)

    I. අදාල නිලධාරියා/නිලධාරිනියගේ මරණ සහතිකය හෝ නිසියාකාරව සහතික කරන ලද පිටපතක්.
    II. ණය අනුමත කර යවන ලද අයදුම්පතේ (ආයතන සංග්‍රහයේ 26 පරිශිෂ්ඨය අනුව) සහතික කල පිටපතක්.
    III. අදාල නිලධාරියා / නිලධාරිනිය මියගිය හෝ පූර්ණ අකර්මන්‍ය තත්වයට පත්වන අවස්ථාව වන විට එම නිලධාරියා / නිලධාරිනිය සේවය හැරයාම, සේවයෙන් පහ කිරීම, වැඩ තහනමකට ලක්ව සිටීම, වැටුප් රහිත නිවාඩු ලබා සිටීම හෝ සේවයෙන් විශ්‍රාම ගන්වා සිටියේද නැතිද යන බව හා මියයාමට හේතුව සියදිවි හානිකර ගැනීමක්ද නැත්ද යන බව ආයතන ප්‍රධානියා විසින් සහතික කළයුතු ලිපියක්.
    IV. මියගිය නිලධාරියා / නිලධාරිනියගේ වැටුපෙන් මේ දක්වා අයකරන ලද ණය වාරික හා පොළිය පිළිබඳව මාසික විස්තර සඳහන් ගෙවන නිලධාරියා විසින් සහතික කරන ලද පහත දැක්වෙන පරිදි වාර්තාවක්.

| වර්ෂය | මාසය | නිලධාරියාගෙන් අයකල වාරික මුදල (රු.) | නිලධාරියාගෙන් අයකල පොළිය (රු.) | රජය විසින් වැයකර ඇති පොළිය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| | | | | | |

    V. මියගිය නිලධාරිනියගේ කාලත්‍රයා හෝ යැපෙන්නන්ගේ නම් සහ ලිපියනයන්.
    VI. මියගිය නිලධාරියා/නිලධාරිනියගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්.

**තැපැල් ලිපිනය :** අධ්‍යක්ෂ ජනරාල්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,

මහා භාණ්ඩාගාරය, කොළඹ 01.